


## මෙය භයානක ප්‍රවනතාවකි

ඉදිරිපත් වන අදහසට අප එකඟ වුණ ද නොවුණ ද සිය අදහස් නිදහසේ ඉදිරිපත් කරන්නට කෙනෙකුට ඇති ශුද්ධ වූ මානව අයිතියට අපි ගරු කරන්නෙමු. ඒ අර්ථයෙන් ශ්‍රී ලාංකික සිනමා කරුවන් කීපදෙනෙකු දේශ ද්‍රෝහීන් බවත් ඔවුන් එල්ලා මරා දැමිය යුතු බවත් කියමින් මිනිසුන් උසිගන්වන ව්‍යාපාරයට අපි තරයේ විරුද්ධ වෙමු.

අප එසේ කරන්නේ අප ඔවුනගේ සිනමා කෘති හා එකඟ වන නිසා නොවේ. ඒ කෘති ඉදිරිපත් කරන්නට ඔවුනට ශුද්ධ වූ අයිතියක් ඇති බව අප අදහන නිසාවෙනි. නිර්මාණකරුවනට එරෙහිව සාහසිකත්වය යොදා ගැනීම හෝ එසේ යොදා ගන්නා බවට තර්ජනය කිරීම හෝ සිහිබුද්ධියක් ඇති කිසිවකු අනුමත නොකරනු ඇත.

නිදහසේ තම අදහස් ඉදිරිපත් කරන්නට මිනිසුනට ඇති අයිතිය වළලන්නට එන මොනයම් හෝ ව්‍යාපාරයක් වේ නම් අපි එයට තරයේ විරුද්ධ වන බව මෙසේ ලියා තබමු. එය අපේ යුතුකමකි.

කවරයේ මුරලි හා සංගක්කාරගේ ඡායාරූප

**ඔස්කා පෙරේරා**






## උතුරු දකුණු ගැටයට මහින්දගේ ගෙල හිරවෙයිද..?

**අනුර හොරේෂස්**

මෙම වසර අවසානයේදී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය ශ්‍රී ලංකාවට අතිශයින් තීරණාත්මක ය. රටේ සාමය, සමගිය, ආර්ථිකය, සංවර්ධනය සහ සංස්කෘතිය අද පවතින තත්ත්වයට වඩා ඉහළින් ඔසවා තබනවා ද, නැතිනම් යුද්ධයට යොමු වනවාද, ආර්ථිකය, සංවර්ධනය සහ සංස්කෘතිය නැත්තටම නැති කැර ගන්නවාද, යන වැදගත් කාරණා මෙවර ජනාධිපතිවරණයෙන් ඉක්බිති තීරණය කෙරෙනු ඇත.

මෙවර ජනාධිපතිවරණය පෙර පැවැති ජනාධිපතිවරණ වලට වඩා නැවුම් මුහුණුවරක් ගෙන ඇත. ඒ මහින්ද රාජපක්ෂ මහතා නිසා ය. දීර්ඝ කාලයක් තිස්සේ බණ්ඩාරනායක නිල ලාංඡනය යටතේ පැවැති ශ්‍රීලංනිප යේ මෙවර ජනාධිපති අපේක්ෂකයා බවට රාජපක්ෂ මහතා පත් වූයේ අහම්බෙන් නොවේ. ලක්ෂ සංඛ්‍යාත ශ්‍රීලංනිප ඡන්දදායකයන්ගේ බලවත් ඉල්ලීම මත නොදී බැරිකම නිසාම ය. ඒ සමග බණ්ඩාරනායක පරපුරට නැවතීමේ ලකුණ තැබිණ. තවත් පැත්තකින් මෙහෙම කාරණාවකුත් පෙනෙන්නට තිබේ. ඒ, පසුගිය කාල වකවානු වල රටේ නායකත්වයට පත් පුද්ගලයන් සහ ඔවුන්ගේ සමහර කැබිනට් ඇමැතිවරුන්, මන්ත්‍රීවරුන් සහ හෙන්චයියන් ගහපු ගැහිලි ය. ජනතාව ගොනාට අන්දවමින් ඔවුන් පිට ජීවන බර පොදි පටවමින් මොවු-න් රොත්ත ලස්සෙට කොඩි දමූ හැටි. භීෂණයයි, දූෂණයයි වපුරමින් මුළු රටම අමු අමු සොහොනක් කළ හැටි වැනි කාරණා සමහර දේශපාලකයන්ට අද මතක නැතත් ජනතාවට ඒ බව හොඳටම මතකය. මෙන්න මේ හේතුවද ගෙන බලන කළ මහින්ද රාජපක්ෂ ගේ ජනාධිපතිවරණ සටන ශ්‍රීලංනිප ඡන්දදායකයන්ට පමණක් නොව කොටි සංවිධානයේ සාමාජිකයන්ට ද නැවුම් අත්දැකීමකි. මන්ද මහින්ද රාජපක්ෂ මහතාගේ දේශපාලන ඉතිහාසයේ බොරුව, වංචාව, කපටිකම සහ බොරු වලවල් කැපීම වැනි අත්දැකීම් මොවුන් කාහට වත් නැති බැවින් ය.

රටේ ජනතාව පක්ෂ බේදයකින් තොරව පවසන්නේ මහින්ද රාජපක්ෂ හොඳ මිනිහෙක් බව ය. රාජපක්ෂ උන්නැහේ දකුණේ. කුරහන් පාට සාටකේ දාගෙන දේශපාලනය කරන එයත්, දේශපාලනය කළ එයාගෙ අප්පොච්චිත් රටට ජනතාවට අහිතකර තීන්දු, තීරණ එදත් ගත්තෙ නෑ.. අදත් ගන්නේ නෑ.. මතුටවත් ගන්නේ නෑ.. ඔහොමයි රටේ බහුතර ජනතා මතය.

මේ සෙටිෆිකේට් එකම අද මහින්ද රාජපක්ෂ මහතාට පාරාවළල්ලක් වී ඇතුවාට සැකයක් නැත. මඟ හිටියොත් තෝ නසී.. ගෙදර ගියොත් අඹු නසී .. යන ආප්තෝපදේශයේ හොඳම වර්තමාන නිර්මාණය රාජපක්ෂ මහතා ය. මොකද එහෙම කියන්නේ..? ලංකාවේ දේහපාලනයේ හැටි එහෙමය. රජකම ගන්න නම් ජනතාවට බොරු කියන්න ඕනේ. ජනතාවට කොකා පෙන්වන්න ඕනේ. කපටිකමින් අගතැන්පත් වෙන්න ඕනේ. හක්කේ බුදු රැස් සමග බො-ක්කේ දඩමස් හංගාගෙන ඉන්න ඕනේ. ඉතින් එවැනි දේශපාලන වටපිටාවක ජීවත් වූ මහින්ද රාජපක්ෂට වර්තමාන දේශපාලන කැඳ හැලියේ ශ්‍රීලංනිප ජනාධිපති අපේක්ෂකත්වය හිමි වීම දුවැන්ත අභියෝගයක් නෙවෙයි ද?

දැන් ඉතින් ජනපතිවරණ සටන පමණක් නොවේ... තිස්තුන් කෝටියක් දෙවි දේවතාවුන් වහන්සේලාගේ ආශිර්වාදයත් එක්ක රාජපක්ෂ මහතා පූරුවේ පිනෙන් ජනාධිතිවරණයෙන් ජය ලබා රටේ ජනාධිපති වුවහොත් ඉදිරියටත් ජනතා සෙටිෆිකෙට් එක ප්‍රවේශම් කරගෙන වැඩ කරන්නේ කොහෙ-ාමදැයි කියන කාරණාව තමයි එතුමා අභිමුව තිබෙන පළමු අභියෝගය.

මොකක්ද මේ දෙවැනි අභියෝගය.? ඒක තමයි එල්ටීටීඊ ප්‍රශ්නෙට සරළව කියනවා නම් ප්‍රභාකරන්ට රටෙන් බාගයක් දෙනවාද නැද්ද..? (කවුරුත් කියන්නේ ඒ විදිහට නිසා මමත් ලිව්වා ඒ විදිහටම) මේ ප්‍රශ්නයට අනිත් අපේක්ෂකයා බොහෝම පැහැදිළි පිළිතුරු දී අවසන්. ඒ කියන්නේ එජාප අපේක්ෂක රනිල්

> මහින්ද රාජපක්ෂ ගේ ජනාධිපතිවරණ සටන ශ්‍රීලංනිප ඡන්දදායකයන්ට පමණක් නොව කොටි සංවිධානයේ සාමාජිකයන්ට ද නැවුම් අත්දැකීමකි. මන්ද ඔහුගේ දේශපාලන ඉතිහාසයේ බොරුව, වංචාව, කපටිකම සහ බොරු වලවල් කැපීම වැනි අත්දැකීම් මොවුන් කා හට වත් නැති බැවින් ය.

වික්‍රමසිංහ මහතා. වික්‍රමසිංහ මහතා මොකක්ද කිව්වේ. එජාපෙට එදත් තිබුණේ අදත් තියෙන්නේ වෙනස් නොවන ප්‍රතිපත්තියක්. රට කඩන්න, බෙදන්න හෝ ඊට පදනම වැටෙන කිසිම තීන්දුවකට යන්නේ නැහැ... රනිල් කිව්වේ ඔය විදිහට. එතුමා කෙලින් කතා කරන කෙනෙක් විදිහට ප්‍රසිද්ධයි. රටට සාමය ළඟා කැර දෙන්න එතුමා තුළ තියෙන්නෙ ලොකු කැක්කුමක්. ඒ නිසා රටේ සාමය වෙනුවෙන් තමන්ගේ හිස් ගෙඩිය නොදී ප්‍රභාකරන් ඉල්ලන අනිත් ඕනෑම දෙයක් දෙන්න රනිල් වික්‍රමසිංහ මහතා සූදානම් බව රටට ඔප්පු කොට හමාරයි. වෙනස් නොවන ප්‍රතිපත්තියක් ගැන රනිල් කතා කළාට ක්‍රියාවේදී එයත් වන්නේ නැහැ ප්‍රතිපත්ති වෙනස් වුණේ කො-හොමද කියලා. ඒ බවත් ජනතාව දන්නවා.

වික්‍රමසිංහ මහතා 2000 දී බලය ලබා ගත්තේ මෙසේ වෙනස් නොවන ප්‍රතිපත්ති ප්‍රකාශ කිරීමෙන් ය. හිටපු ගමන් 2002 දී ප්‍රභාකරන් එක්ක ගිවිසුමක් අත්සන් කළා. ඊට පස්සෙ මොකක්ද වුණේ..? කොළඹ අධි ආරක්ෂක කළාප වල තිබුණ මාර්ග බාධක, බංකර් ඉවත් කළා. බොහොම හොර රහසේ මාර්ග බාධක වලින් මිදී කොළඹට ආයුධ ස්වල්ප වශයෙන් ගෙන ආ කොටි සාමාජිකයෝ ඊට පස්සෙ තොග පිටින් ආයුධ, පුපුරණ ද්‍රව්‍ය කොළඹට ප්‍රවාහණය කළා. (ඒවා තවම ප්‍රයෝජනයට ගෙන නැහැ) යුද හමුදාවේ, පොලීසියේ ඔත්තු සේවා නිළධාරීන් බුරුතු පිටින් කොටින 'ට මරා දමන්න හැකි වාතාවරණයක් සකස් කර දුන්නා. කොටින්ගේ ඔත්තු සේවා ප්‍රධානි පොට්ටු අම්මාන් ට පමණක් නොව ප්‍රභාකරන්ටත් මර උණ ගෙන දුන් අතුරුගිරියේ මිලේනියම් සිටි හි තිබූ යුද

4 වන පිටට

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| **NSW** | **WA** |
| Lakshman Kodituwakku | Kapila Hemantha Balage |
| 02 9626 7660 | 08 9456 1972 |
| 02 9837 5055 | |
| **QLD** | **ACT** |
| Ananada Samaratunga | Asoka Nimalasiri |
| 07 3372 7953 | 0439 925 241 |
| **SA** | **TAS** |
| Chandta Eeriyagama | Anura Seneviratne |
| 08 8331 2318 | 03 6327 4259 |

වෙළඳ දැන්වීම්/Advertising
ඩෙන්සිල් ජයවීර/ Denzil Jayaweera

**සන්නස පිරිවර**

| | |
|---|---|
| අනුර හොරේෂස් | Anura Horetious |
| සිසිර දිසානායක | Sisira Dissanayaka |
| ශ්‍රීනාත් මද්දුමගේ | Srinath Maddumage |
| අසෝක සුබසිංහ | Asoka Subasinghe |
| සාලිය ගලප්පත්ති | Saliya Galappaththi |
| වි ක ධර්මබන්ධු | W. K. Dharmabandhu |
| ආචාර්ය විද්‍යානි මනතුංග | Dr Vidyani Manathunga |
| චන්දි මාපා | Chandi Mapa |
| ශ්‍රියාණි මද්දුමගේ | Sriyani Maddumage |
| මහින්ද දිසානායක දිවුල්ගනේ | Mahinda Dissanayaka Diwulgane |

සන්නස පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

සන්නස SANNASA
අපේ උරුමය වෙනුවෙන්

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**බෙදාහැරීම් සහය**
ප්‍රියන්ත පෙරේරා

**Sannasa**
PO Box 172 Reservoir
Vic 3073 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel : 03 9310 4196 /0425 720 932
Fax : 03 9310 5569